## යටියන්තොට ප්‍රාදේශීය සභාව
## කෑගල්ල දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට යටියන්තොට දේශීය සභාවේප්‍රා මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | 2016 හා 2017 වර්ෂ සඳහා උසාවි දඩ ආදායම් රැස්කිරීම වෙනුවෙන් ගෙවිය යුතු කාර්ය මණ්ඩල දීමනා රු. 270,690 ක් සහ ඉකුත් වර්ෂයට අදාල විගණන ගාස්තු රු. 82,567 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. මෙවැනි අඩුපාඩු නැවත නොවීමට වග බලා ගනිමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ පළාත් පාලන කර්මාන්ත පරිපාලනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු. 217,910 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. මෙවැනි අඩුපාඩු නැවත නොවීමට වග බලා ගනිමි. |

(ආ) නොසැසඳුන ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛන අතර රු. 2,273,882 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් වැටුප් ප්‍රතිපූර්ණ රු.182,582 ක් 2019 පෙබරවාරි මස ලැබී ඇත. සභික දීමනා රු.120,000 ප්‍රතිපූර්ණය කර නොමැති බැවින් අදාල සභිකයින්ගෙන් අය කිරීම සඳහා ලිපි යවා ඇත. සේවක ණය ඉදිරි වර්ෂයේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. මුද්දර බදු රු.390 ක වෙනස 2019 වර්ෂයේදී නිරවුල් කර ඇති අතර වාහන ගිණුම්ගත කිරීමේදී සිදුවී තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින රු. 65,621 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි. | අවශ්‍ය ගැලපීම්කර අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක කාලයක් ඉක්මවූ ලැබියයුතු ආදායම් ආධාර රු. 120,000 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ආදායම් ආධාර අදාල සභික මහත්ම මහත්මීන්ගෙන් අය කිරීමට කටයුතු කර ඇත. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් ඉක්මවූ ගෙවියයුතු ගිණුම්වල එකතුව රු. 3,306,679 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී රු. 1,721,115 ක ගෙවිය යුතු ගිණුම් නිරවුල් කර ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 33 | 86,181 | වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ වරිපනම් හා අක්කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | 2019 ජූනි 30 දින වන විට සියළුම වරිපනම් හිඟ හා අක්කර බදු හිඟමුදල් අය කර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි | | | | |
| | (i) 571 (2) | 68,611 | 2006 සිට 2015 දක්වා ගිණුම්ගතකර තිබූ පොදු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2006 සිට 2015 දක්වා රු.399,749 ක පොදු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි මුදල් නිදහස් කිරීමට අදාලව අවසන් සිහිකැඳවීම් ලිපිය යැවීමෙන් පසු ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 1646 | - | වාහන 04 කට අදාල සමාලෝචිත වර්ෂයේ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට නියමිත දිනට සභාවේ වාහනවල ධාවන සටහන් හා මාසික සාරාංශ එවීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | සභාව සතු වාහන 05 ක ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු වාහනවල දැවෙන ඉන්ධන පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව මගින් දැනට ට්‍රැක්ටර් රථ 03 ක ඉන්ධන පරීක්ෂණ සිදු කර ඇති අතර ඉතිරි වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | වසර 05 කට වරක් සිදුකළ යුතු වරිපනම් තක්සේරුව 2012 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ නව වරිපනම් තක්සේරුව දැනට සිදු කරමින් පවතින බව දන්වමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,301,488 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,042,506 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,959,036 | 4,959,036 | 4,257,,495 | 790,972 | 4,356,345 | 4,356,345 | 3,532,844 | 823,501 |
| කුලී | 5,759,118 | 5,759,118 | 5,648,196 | 203,671 | 91,136 | 91,136 | 19,385 | 71,750 |
| බලපත්‍ර ගාස්තු | 828,335 | 828,335 | 775,151 | 53,184 | 1,365,682 | 1,365,682 | 1,352,531 | 13,150 |
| වෙනත් ආදායම් | 74,993,272 | 74,993,272 | 56,611,312 | 26,762,732 | 14,052,447 | 14,052,447 | 3.363,031 | 17,415,479 |

2.2.2 ඉඩම් බදු දීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති ඉඩම් බදු රු. 77,240 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළු සහගත තත්ත්වය නිසා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් අදාල කුලිය නොගෙවන අතර,ඉඩමේ ගැටළුව නිරවුල් කරගත් පසු බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 5,528,547 ක් හා මුද්දර ගාස්තු රු.17,602,939 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | උසාවි දඩ උපලේඛන සකස් කරමින් පවතින අතර කඩිනමින් එම හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බවත් රු.12,868,689 ක මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා පළාත් සභාව වෙත යොමු කර ඇති බවත් දන්වා සිටිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක් වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු ප්‍රධාන කාරණා 18 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඒ අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා 10කට අදාල අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර,එමගින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කර ගනිමින් එම අතුරු ව්‍යවස්ථා කඩිනමින් පනවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කර ළඟා වී ඇත්දැයි පරීක්ෂා කළ නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තා සකස්කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පවතින අතර එහි ප්‍රගතිය අර්ධ වාර්ෂිකව මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | 2008 වර්ෂයේ සිට කොම්පෝස්ට් අංගනයට ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජල සැපයුමක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ලබාදෙන ජල මූලාශ්‍රයට වඩා ඉහළින් කොම්පෝස්ට් අංගනය පිහිටා තිබීම නිසා එමගින් ජලය ලබා ගැනීමක් කළ නොහැකි බව තහවුරු විය. මේ සම්බන්ධයෙන් මහා සභා අනුමැතියට ඉදිරිපත් කර ජලය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ii) | නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරිම සඳහා සෞඛ්‍ය ආරක්ෂිත පරිසර හිතකාමී ක්‍රමවේදයක් සකස්කර ගෙන නොතිබුණි. | නොදිරන අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් වරින් වර ප්‍රධාන අමාත්‍යාංශය, පළාත් පාලන සහකාර කොමසාරිස් දැනුවත් කර අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව ලැබී ඇති බ්ලේලර් යන්ත්‍රය භාවිතා කිරීමෙන් මෙම තත්ත්වය යම්තාක් දුරකට මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැණුවත් වී තිබූ අතර එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගත යුතු වේ. | සිව් අවුරුදු සැලැස්ම තුලින් දිගුකාලීන සැලසුම් පිළියෙල කර ඇත. |

3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සහ සබරගමුව පලාත් සභාව මඟින් ලබාදෙන ලද වටිනාකම රු. 35,267,420 ක් වූ වාහන 10 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය සභාවට පවරා ගත යුතුවේ. | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ලබා දුන් වාහන 05ක් හා සබරගමුව පළාත් සභාව මගින් ලබා දුන් වාහන 05ක් මහ සභාවේ අනුමැතිය ලැබුණු පසු ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සඳහා හැකි ඉක්මනින් කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) අනුමත කාර්ය මණ්ඩලය තුල පැවැති තනතුරු 23 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමකින් තොරව අනියම් පදනම මත හා සේවා ගිවිසුම් මත සේවකයින් 12 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු 01 ක් සම්පූර්ණ කර ඇත. අනෙකුත් පුරප්පාඩු සම්බන්ධ තොරතුරු මාසික වාර්තා මගින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතද, අර්ධ වාර්ෂික වාර්තා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙතද ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) 1985 ජනවාරි සිට 2015 අගෝස්තු දක්වා කාලයට අදාල විශ්‍රාම ගිය, සේවය හැරගිය, හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයන් 40 දෙනෙකුගෙන් අයවියයුතු රු.187,605 ක ණය අයකර ගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ රු.187,605 ක මුදලින් ඉදිරියේදී අය කර ගත හැකි අයගෙන් අය කිරීමටත්, මියගිය අයගේ ණය කපා හැරීමටත් කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| ගලි අපද්‍රවය බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ දී ගලි සේවාව ලබා දීමට නොහැකි වී තිබුණි. | නාගරික ජනතාවටද ප්‍රයෝජනවත් පරිදි ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් කළ යුතුවේ. | ගලි අපද්‍රව්‍ය, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක වලකට 2014 වර්ෂයේ යොමු කළ අතර ජනතා විරෝධය හේතුවෙන් එම ස්ථානයට අපද්‍රව්‍ය බැහැර කිරීමට නොහැකි විය. සනීපාරක්ෂක ලෙස ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතු ඉඩමක් නොමැති බැවින් අවශ්‍ය ප්‍රතිපාදන සපයාගෙන ඉඩමක් මිලදී ගැනීමට හා අපද්‍රව්‍ය සනීපාරක්ෂක පද්ධතියක් සකස් කිරීමට කටයුතු යොදමි. |

3.5 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද සතිපොළ හා වැසිකිලි පද්ධතියට අදාල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ කඩ කාමර 02 ක් හා බිම් මහල 2017 පෙබරවාරි මාසයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | සභා දේපලවලින් අදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නව දෙමහල් ගොඩනැගිල්ල කිහිපවරක්ම ටෙන්ඩර් කළද කිසිවෙක් ටෙන්ඩර් ලබා නොගත් බැවින් සභා තීරණයක් මත එහි කඩ කාමර සකස් කර ටෙන්ඩර් කිරීම සඳහා කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එහි බිම් මහලේ මස්කඩ සඳහා ඉදි කර ඇති කඩකාමරද වෙනත් වෙළඳාමක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇති අතර, තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| (ආ) වටිනාකම රු. 4,124,600 ක් වූ වාහන 06 ක් වර්ෂ 01 සිට 09 දක්වා කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම කළ යුතුවේ. | කාලයක් නිෂ්ක්‍රීය පවතින වාහනවලට අදාල මෝටර් රථ පරීක්ෂකගෙන් තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලැබුණු පසු අළුත්වැඩියා කිරීම හෝ වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහ පාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 34 ක රු.1,137,500 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා වැය විෂයයන් 18 ක රු.13,351,139 ක ප්‍රතිපාදන වලින් සියයට 50 ත් සියයට 99 ත් අතර එකතුව රු. 14,488,639 ක් උපයෝජනය කර නොතිබුණි. | තාත්වික අයවැය ලේඛණ පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා සාර්ථක අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යා යුතුය. | 2019 වර්ෂයේ සිට පිහිටුවාගෙන ක්‍රියාත්මක වේ. |